**කින්නියා ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල්28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 12දිනද, කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන මඟින් 2019 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ සේවක ණය හිඟ ශේෂය සේවක ණය ලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල අතර රු.92,951 වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම් වාර්තාවේ ගැලපීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | 2018 මැයි මාසය සඳහා මුද්දර ගාස්තු රු.7,821,540ක් සහ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) | පසුගිය වර්ෂයේ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙන ඒමේදි රු.50,925කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ඉදිරියට ගෙන ඒම සනාථ කළ යුතුවේ. | ඉදිරි කාලයේදි මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති | ඉඩම් හා ගොඩනැගිලිවල සත්‍ය වටිනාකම | ඉදිරි කාලයේදි මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කර |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.35,511,602ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලිවල සත්‍ය වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇස්තමේන්තු කරමූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (v) | සභාවේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසියේ විකිණීමට නිර්දේශ කළ අයිතමයන් 60ක් විකුණා තිබූ නමුත් එහි වටිනාකම සහ විනාශ කිරීමට නිර්දේශ කළ අයිතමයන් 295ක් විනාශ කර තිබුණත් එහි මිලදී ගත් වටිනාකම ගණනය කර වත්කම්වලින් අඩුකරදක්වා නොතිබුණි. | අඩුකළ සහ විනාශ කළ අයිතමයන්ගේ වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සභාව සතු මෝටර් රථ 19ක් සහ කරත්තවල වටිනාකම රු. 18,799,710ක්, පිරියත හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවි කිරීම් පිළිවෙලින් රු.3,275,705ක් සහ රු.4,683,015ක් සම්බන්ධයෙන් ඒවායේ වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(i) ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල හිඟ හිටව පවතින වෙළෙඳ පොල බදු කුලි රු.5,914,886ක් පිළිබඳව අඛණ්ඩව වර්ෂ 05කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණද, හිඟ මුදල් අයකිරීමට හෝ ලේජර් ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල ඇතැම් වර්ෂ සඳහා පමණක් තොරතුරැ ලබාගත හැකිවි තිබුණි. පසුගිය කාලයේ තොරතුරු ලබා ගත නොහැකි නිසා අදාල ක්‍රියාමාර්ග ගත නොහැකිව ඇත. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| • ආපසු ගෙවිය යුතු තැන්පතු රු.5,872,553ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා ප්‍රමාණවත් තොරතුරු ද නොවීය. | ප්‍රමාණවත් තොරතුරු ලබාගෙන අවශ්‍ය කටයුතු සිදු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| • සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් රු.1,210,976ක් අර්ථ සාධක අරමුදලට ගෙවීමට කටයුතු නොකර වර්ෂ 05 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කරමින් තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් විධිමත්ව ගෙවීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ උපදෙස් මත සභාවේ අවසරය සහිතව සුදුසු පියවර ගනු ලැබේ. |
| • වර්ෂ දෙකකට අධික කාලයක සිට ණයහිමි ශේෂය රු.2,291,089ක් දක්වා තිබුණද, ඒවා හඳුනාගෙන අදාල පුද්ගලයින්ට ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ හඳුනාගෙන ගෙවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුවේ. | තොරතුරු ලද වහාම ගැලපීමට කටයුතු කරමි. |
| • සභාවේ සේවකයින්ගෙන් අයකළ විශ්‍රාම දායක මුදල් රු.2,227,497ක් ගෙවා නිරවුල් නොකර වර්ෂ 10කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි. | සුදුසු කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ | මූල්‍ය ප්‍රතිපත්ති සැලසුම් කිරීම, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, පාරිසරික සහ පොදු පහසුකම් වැනි කාරණා සඳහා | වෙනම කමිටු ස්ථාපිත කර එයට අනුකූලව පියවර ගත | සභාවේ කටයුතු පහසු කිරීමේ අරමුණින් අදාල කමිටු පත්කර උපදෙස් ලබා ගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| | (2) වගන්ති | වෙන වෙනම කමිටු ස්ථාපිත කර උපදෙස් ලබාගත යුතු වුවත් සියයට 25ක උපදෙස් කමිටු පමණක් පවත්වා තිබුණි. | යුතු වේ. | සම්බන්ධයෙන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03 සිට 06කට වැඩි කාල පරාසයට අදාල ලංසු, කොන්ත්‍රාත් ඇප මුදල් සහ මාරු නොකළ චෙක්පත් තැන්පතු ආදිය ගණනය කර මුදල් රෙගුලාසි අනුව ගෙවා නිරවුල් කිරිමට හෝ ආදායමට මාරු කිරිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසියට අනුකූලව කඩිනමින් කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු සිදුවිම වලක්වා ගැනිමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ඇ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් කරුවෙකුට එකතු කළ අගය මත බදු ලෙස රු.756,010ක් ගෙවීම් කර තිබුණි. මේ පිළිබඳව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | "වැට් ඉන්වොයිසිය" (VAT Invoice) ලැබීමෙන් පසුව ඒ මත පදනම්ව ගෙවීම් කිරිම තහවුරු කළ යුතුවේ. | ඉදිරි අනාගතයේදි ව්‍යාපෘති සඳහා VATගෙවිම අදාල කොන්ත්‍රාත්කරුට ලබාදීමට ප්‍රථම VAT Invoice ලබා ගැනීමටත් ලදුපත් ලබාගැනීමටත් කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,184,946ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,366,600ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 8,850 | 10,845 | 458 | 10,297 | 4,585 | 6,910 | 4,15 | 1,995 |
| කුලී | 2,045 | 3,990 | 10 | 3,980 | 1,470 | 2,861 | 916 | 1,945 |
| එකතුව | 10,895 | 14,835 | 468 | 14,277 | 6,055 | 9,771 | 1,331 | 3,940 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බලපත්‍ර ගාස්තු ආදායම් රු.2,045,000ක් වශයෙන් ඇස්තමේන්තු කර තිබුණත් රු. 10,000ක් පමණක් අයකර තිබුණි. | ඇස්තමේන්තු නියමිත ආකාරයෙන් සැලසිමට කටයුතු කළ යුතුවේ. | එම මුදල පමණක් අයකර ගත හැකිව තිබුණි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභා බල පිහිටි නිශ්චල දේපල හඳුනාගෙන ඒවායේ වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.මේ හේතුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 2ක ආදායමක් අහිමි වී තිබුණි. | වරිපනම් බදු නියමිත පරිදි අයකිරීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ තීරණය ක්‍රියාත්මක කර ඉදිරියේදි වරිපනම් හා බදු අයකිරිමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 කඩ කාමර බදු ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බදුකරුවන් කඩකාමර බදු ගැනීමේදි ආරම්භයේදි ගෙවනු ලබන බදු මුදල කුලි අත්තිකාරම් | නිවැරදි ආකාරයෙන් ගිවිසුම්වලට එළැඹීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | ලෙස සලකන අතර එම අත්තිකාරම් කාලය සම්පූර්ණ වූ පසුව කඩකාමර පවත්වාගෙන යාම අතහැර දමති. මේ නිසා සභාව විසින් අපේක්ෂා කළ ආදායම් අහිමි වේ. මේ ආකාරයේ කාර්යයන් වලක්වා ගැනිම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් හඳුනාගෙන එය ක්‍රියාත්මක කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. 7,284,748ක හිඟබදු වලින් රු.7,273,841 ක් වර්ෂ 09කට පෙර කාලයකට අදාල විය. | හිඟ මුදල් අයකිරිමට සුදුසු පියවර ගත යුතුවේ. | ඉදිරියේදි මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | පොදු වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර 36 ක් සහ විවෘත කඩ කාමර 32 ක් සඳහා රු.1,720,000 ක් ආපසු ගෙවන තැන්පතු වශයෙන් අයකළ යුතුව තිබුණත් මේ දක්වා රු.593,000 ක් පමණක් සභාව අයකර ගෙන තිබුණි. | කඩකාමර සඳහා ආපසු ගෙවනු ලබන තැන්පතු නියමිත පරිදි අයකළ යුතුවේ. | ආවරණය කළ කඩකාමරවලින් මුළුමනින්ම අය කරගෙන ඇත. විවෘත කඩකාමරවලින් දැනට අයකරමින් පවති. |

**2.2.5 ඉඩම් විකුණුම් මත බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 සිට 2018 වර්ෂ කාලපරිච්ඡේදය සඳහා ඉඩම් විකුණුම් මත 1%ක විකුණුම් බදු ලෙස රු. 3,948,206ක් ද, 2019 වර්ෂය සඳහා ඉඩම් විකුණුම් බදු ද, ගණනය කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් ලබාගැනීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදි නියමිත කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණයෙන්ම අයකිරිමට කටයුතු කරනු ලැබේ. |

**2.2.6 උසාවි දඩ ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ අවසානය දක්වා වූ උසාවි දඩ මුදල් සම්පූර්ණයෙන්ම ලබාගැනීම සඳහා විගණන දිනය වන 2020 මැයි 20 දින වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නියමිත කාලය තුළ ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදි නියමිත කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණයෙන්ම අයකිරිමට කටයුතු කරනු ලැබේ. |

**2.2.7 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂිකව මුද්දර ගාස්තු අයකළ යුතු වුවද, 2019 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාලය තුළ ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි නියමිත කාල පරාසය තුළ සම්පූර්ණයෙන් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා 05 ක් 2018 වර්ෂයේදී සකස් කර නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා සකස් කර අනුමත කිරිමට තීරණය කර ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කසල වෙන් කර රැස්කිරිමේ ක්‍රියාවලිය විධිමත්ව සිදු කර නොතිබුණි. | කසල වෙන්කර ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | යන්ත්‍ර ලබා ගැනිමට කටයුතු කරමින් පවතී. ඉදිරියේදි මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ. |
| (ii) | සභා බලප්‍රදේශයේ රැස් කරනු ලබන කසල ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ බැහැර කරනු ලබන නමුත්, දිරන හා නොදිරන කසල වෙන් කර | කසල වෙන්කර රැස්කිරිමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය මගින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |

(iii) **පාරිසරික ගැටළු**

| | | |
|---|---|---|
| සභාව විසින් මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍ර ලබානොගෙන සත්ව ඝාතකාගාර පවත්වාගෙන ගොස් තිබුණි. තවද, මෙහි ඝාතනය කරනු ලබන සත්ව රුධිරය ඝන අපද්‍රව්‍ය ආසන්නයේ පිහිටි ගංඟාවට මිශ්‍රවන නිසා පරිසරය දූෂණය වීමට ඉඩ සැලසී ඇත. මෙවැනි පාරිසරික ගැටළු නිරාකරණය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන එය විසඳා ගැනීමට කටයුතු කඩිනම් කර නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ගැනීමෙන් අනතුරුව සත්ව ඝායනාගාරය පවත්වාගෙන යැමට කටයුතු කළ යුතු වේ. | පුද්ගලික ආයතනයක් විසින් ගවඝාතකාගාරයක් ආරම්භ කිරීමට සභාව සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ පසුව මෙම ගැටළුව ඉදිරි අනාගතයේදී විසඳනු ලැබේ. |

(iv) **තිරසාර සංවර්ධන ඉලක්ක**

| | | |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | කටයුතු දැනට කෙරීගෙන යනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අක්‍රිය බැංකු ගිණුම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංවර්ධන වැඩසටහන් සඳහා 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ බැංකු ගිණුමේ රු.85,607ක් අක්‍රිය බැංකු ශේෂයක් විය. | බැංකු ගිණුම යාවත්කාලීන කිරීම හෝ වසා දැමීමට ක්‍රියා කළ යුතු වේ. | වර්තමානයේ සියළුම බැංකු කටයුතු පොදු බැංකු ගිණුම මාර්ගයෙන්ම සිදු කරනු ලැබේ. |
| (ආ) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ලබාදුන් නිර්දේශ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දෙවැනි වරටත් නැවත තක්සේරු කිරීම් සිදුකළද විකිණිය නොහැකි |

| | |
|---|---|
| අනුව වෙන්දේසියේ විකිණිය යුතු වර්ග 06ක භාණ්ඩ 06ක් වෙන්දේසි මිල තක්සේරු කර තිබුණත් එම වත්කම්වල ඇස්තමේන්තු වටිනාකම වැඩියෙන් දැක්වීම නිසා ඒවා විකිණී නොමැති අතර සභාව විසින් නැවත තක්සේරු කර විකිණීමට කටයුතු කර නොතිබුණි. | නිසා නැවතත් වරක් තක්සේරු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**(ආ) නිරවුල් නොකළ අත්තිකාරම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ 10 කට අධික කාලයක සිට නිරවුල් නොකර පැවති රු 1,73,544 ක් විගණන දිනය වන 2020 මැයි 20 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳ විස්තර මෙහි දක්නට නොවීය. දැනට ලබාදෙන අත්තිකාරම් මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කරනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමලෝචිත වර්ෂයේ තනතුරු 09ක පුරප්පාඩුව පැවතිණ. | පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන පුස්තකාල 05ක් මත භාණ්ඩ සමීක්ෂණයේදි පොත් 1211ක් පුස්තකාල භාර නිලධාරීන් විසින් ඉදිරිපත් කර නොතිබුණි. එනමුත් මේ පිළිබඳව විධිමත් විමර්ෂණයක් සභාව විසින් ගෙන නොතිබුණි. | සුදුසු විමර්ශනයක් සිදුකර අදාල වටිනාකම් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකළ යුතුවේ. | අදාල කාරණා සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට දැනුම් දි ඇත. ඔබ විසින් සඳහන් කළ කරුණු පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.4.2 වාහන භාවිතා කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වාහන 06ක්වෙන්දේසියේ විකිණීමටත් වාහන 02ක් අලුත්වැඩියා කිරීමටත් නිර්දේශකර තිබු නමුත් වර්ෂ 2කට අධික කාලයක සිට ඒවා සම්බන්ධයෙන් සුදුසු කටයුතු කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |
| (ආ) | සභාවේ වාහන 03 ක් අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පැවතුණද වර්ෂ දෙකකට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |
| (ඇ) | වාහන 11 ක අයිතිය ලබාගැනීම සඳහා විගණන දිනය වන 2020 මැයි 20 දින දක්වා කටයුතු කර නොතිබුණි. | අයිතිය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |
| (ඈ) | සභාවේ ඇති මෝටර් රථය, ත්‍රිරෝද රථ දෙක, පිකප් රථ දෙක යනාදිය වර්ෂ 03 සිට වර්ෂ 06 ක් දක්වා නිෂ්කාර්යව පැවති අතර ඒවා අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගෙන විගණනයට දැනුම් දිය යුතුවේ. | වෙන්දේසියේ විකිණීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

### 3.4.3 නිෂ්කාර්ය වත්කම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ උප්පාරු ප්‍රදේශයේ සංචාරකයින්ගේ සුභසාධනය පිණිස මහජන වැසිකිළියක් රු.1,000,000 ක පිරිවැයකට ඉදිකර, කොන්ත්‍රාත්කරු විසින් 2016 දෙසැම්බර් 31 දින භාරදෙනු ලැබූ නමුත් මේ දක්වා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි. මෙම ගොඩනැගිල්ල එම ප්‍රදේශයේ ආගමික ස්ථානයක මායිමේ ඉදිකර තිබුණි. මෙලෙස ඉදිකළ ගොඩනැගිල්ලෙහි අයිතිය පිළිබඳව විධිමත් ලියකියවිලි සභාව විසින් ලබාගෙන නොතිබුණි. | සැලැසුමෙහි අරමුණ ළඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ මෙය මහජන භාවිතය සඳහා භාරදීමට කටයුතු කරමින් පවතින අතර ඉඩම සම්බන්ධයෙන් ලිපිලේඛන ලබාගැනීම සඳහා ඉල්ලීම් කිරීමේ ලිපිය කින්නියා ප්‍රාදේශීය ලේකම්වරයාට යවා ඇත. |

**3.4.4 ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය ලබාගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ ලේඛනගත කර භාවිතා කරනු ලබන සහ මහජන භාවිතය සඳහා ලබාදී ඇති ඉඩම් හා ගොඩනැගිලි 17ක් පිළිබඳව ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය රජයට අයත්ව පැවැතිණි. මෙම ඉඩම්වල අයිතිය ප්‍රාදේශීය සභාවේ නමට මාරු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල කටයුතු කඩිනම් කර සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රාදේශීය ලේකම්වරයාට ප්‍රාදේශීය සභාවට මාරු කර දීමේ ඉල්ලීම ඉදිරිපත් කර ඇත. |

**4. ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැපයුම් හා සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදී 2020 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණනය කාර්යයන් සඳහා නිලධාරියෙකු පත්කර තිබු නමුත් විගණන දිනය වන 2020 මැයි 20 දින වන විටත් විගණන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදි මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ. |